(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 2(3)]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2008 නොවැම්බර් මස 15 වැනි සෙනසුරාදා**

## 2008 නොවැම්බර් මස 24 වැනි සඳුදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ යෝජනාව,— 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පහත දැක්වෙන පරිදි විධාන කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශ පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍යම කාර්යාංශය විසුරුවා හැරීම; සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශ පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍යම කාර්යාංශය 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් ලෙස යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් පත් කිරීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## 2008 දෙසැම්බර් මස 01 වැනි සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0706/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) හෝමාගම - මාගම්මන මවුන්ට් ක්ලිපඩ් වත්ත රජයට පවරා ගන්නා ලද්දේ කවදාද;

(ii) පවරා ගන්නා අවස්ථාවේ එහි භූමි ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(iii) පවරා ගැනීමෙන් පසු එහි ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) නිවාස ඉදිකිරීමෙන් පසු ඉතිරිව තිබෙන භූමි ප්‍රමාණය කොපමණද;

(v) එකී භූමිය යොදා ගැනීමට සැලසුම් කර ඇති සංවර්ධන කටයුතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉතිරිව ඇති එම භූමියෙන් ප්‍රධාන පාරට යාබදව පොදු කටයුතු වලට හා ක්‍රීඩා පිටිය ලෙස භාවිතා කරන කොටසක් ඇති බව එතුමිය දන්නෙහිද?

(ඈ) (i) ක්‍රීඩා පිටිය ලෙස භාවිතයට ගන්නා ප්‍රදේශයේ ඉතිරිව ඇති අක්කර 02 ක පමණ කොටසක් පොදු කටයුතු වෙනුවෙන් ඉවත් කර දෙන ලෙස හෝමාගම ප්‍රාදේශීය සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් ඉල්ලීම් කර ඇති බවත්;

(ii) විවිධ මහජන නියෝජිතයින් මාර්ගයෙන්ද මේ සඳහා ඉල්ලීම් කර ඇති බවත්;

(iii) ප්‍රදේශවාසීන් හා ප්‍රදේශයේ පොදු සමිති සමාගම් ද එසේ ඉල්ලීම් කරන ලද බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) ඒ අනුව ප්‍රදේශයට ඇති අවශ්‍යතාවයක් ලෙස සලකා ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමට එම බිම් කොටස ලබා දීමට එතුමිය අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,—නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළොන්නාව ඔරලෝසු කණුව අභියස ඉඩමක ඉදිකර ඇති මුල්ගලක "1999 නිකිණි මස 20 දින කොළොන්නාව සංස්කෘතික නගරය සඳහා මුල්ගල තබන ලදී" යනුවෙන් සඳහන් වන බවත්;

(ii) එදින සංස්කෘතික නගරය සඳහා ආරම්භක උත්සවයක් පැවති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) එදින උත්සවයට සහභාගි වූ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන මන්ත්‍රීවරුන් කවුරුන්ද;

(ii) එම උත්සවය සංවිධානය කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) අදාළ උත්සවය සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) මුල්ගල සහිත පුවරුව ඉදි කිරීමට වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සංස්කෘතික නගරය වෙනුවෙන් මෙතෙක් සිදු කර ඇති වැඩ කටයුතු කවරේද;

(ii) මුල්ගල තැබීමෙන් පසු අදාළ වැඩ සැලැස්මේ ඉටු නොකළ කාර්යයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0767/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, බද්දේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) බද්දේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිලි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0768/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නෙළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නෙළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිලි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0775/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008.07.22 වැනි දින රාත්‍රී දකුණු හා බටහිර මුහුදු කලාපයේ ඇති වූ සුළිසුළං තත්වයෙන් ධීවරයින් අනතුරට පත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සුළිසුළං තත්වයෙන් මියගිය හා අතුරුදහන් වූ ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) අනතුරට පත් ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iv) එම යාත්‍රාවල හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) අතුරුදහන් වූ සහ මරණයට පත්වූ අයගේ පවුල්වලට ලබාදුන් සහන කවරේද;

(vi) හානියට පත් ධීවර යාත්‍රා සහ ආම්පන්න යථා තත්වයට පත්කර ගැනීමට දී තිබෙන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙවිනුවර දකුණ ග්‍රාම නිලධාරි වසමේ මුහුදට ඉතාම සමීපව ඉදිකර තිබෙන "ලයිට් හවුස්" හෝටලයේ හිමිකරුගේ නම හා ලිපිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම හෝටලය ස්ථානගත කිරීමේදී වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන උල්ලංඝණය කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුහුදු වෙරළේ යම් ඉදිකිරීමක් කරන්නේ නම්, ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුත්තේ කවර දෙපාර්තමේන්තුවකින්ද;

(ii) ඒ අනුව ඉහත ඉදිකිරීම සඳහා බලපත්‍රයක් ලබාදී තිබේද;

(iii) එවකට අදාළ අමාත්‍යධුරය දැරුවේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත ඉදිකිරීම නීති විරෝධි බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0777/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අප රටේ මිරිදිය ධීවර කර්මාන්තය සිදු කරන ජලාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වෘත්තියේ යෙදී සිටින ධීවරයින් සංඛ්‍යාව හා පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මිරිදිය ධීවර කර්මාන්තයේ යොදා තිබෙන ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිරිදිය ධීවර කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා රජය ගෙන තිබෙන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2008 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0733/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1994 වර්ෂය වන විට ලංකා ධීවර සංස්ථාව සතුව පැවති ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂයේ ජුනි මාසය වන විට ලංකා ධීවර සංස්ථාව සතු ක්‍රියාත්මක ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

(iii) ශීතාගාර බදු දී තිබේද;

(iv) එසේ නම්, ඒ කොපමණ සංඛ්‍යාවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශීතාගාර බද්දට දී තිබෙන අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) පෞද්ගලික අංශය විසින් පවත්වා ගෙන යනු ලබන ශීතාගාර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0734/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාරා ආයතනය සතුව තිබූ "සයුරි" නෞකාව හා එහි සවිකර තිබූ ජලමාන උපකරණවල රක්ෂිත මුදල කොපමණද;

(ii) "සයුරි" නෞකාව හා ජලමාන උපකරණ සුනාමියෙන් විනාශයට පත්වීමෙන් අනතුරුව රක්ෂණ වන්දි වශයෙන් ලැබුණු මුදල කොපමණද;

(iii) නාරා ආයතනයේ වත්කම්වලින් නෞකාවේ වටිනාකමේ ප්‍රතිශතය කොපමණද;

(iv) නෞකාව රක්ෂණයේ සිට රක්ෂණ වන්දිය ලබා ගැනීම දක්වා වූ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අමාත්‍යාංශය පරීක්ෂණයක් පවත්වා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0735/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ තේක්ක වන වගාව පැතිර ඇති හෙක්ටයාර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවලද;

(iii) පසුගිය දස වසර තුළ, මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල තේක්ක වන වගාවේ තේක්ක ගස් අලෙවියෙන් ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ කටයුතු කළ අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0738/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 'එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක් කර්මාන්ත ගම්මානයක්' යන "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 සඳහා කර්මාන්ත කොපමණ සංඛ්‍යාවක් මේ වනවිට ආරම්භ කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නම් වශයෙන් පිළිවෙළින් කවරේද;

(iii) ආරම්භ කර තිබෙන කර්මාන්ත ශාලාවල අදාළ නිෂ්පාදන කවරේද;

(iv) එම කර්මාන්ත හිමියන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එක් එක් කර්මාන්තය සඳහා "මහින්ද චින්තන" වැඩ පිළිවෙල යටතේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් කොපමණ මුදලක් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් කර්මාන්තය සඳහා කර්මාන්ත හිමියන් කොපමණ මුදලක් ආයෝජනය කර තිබේද;

(ii) දේශීය ආයෝජකයින්ට අමතරව විදේශ ආයෝජකයින් සිටීද;

(iii) එසේ නම්, ඒ කවර කර්මාන්ත සඳහාද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2008 වර්ෂය වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලියාපදිංචි ඇති ගාල්ල දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මකව තිබෙන මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත කවරේද යන්න විස්තරාත්මකව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0739/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගා/උඩුගම මහා විද්‍යාලය "ඉසුරු" පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කිරීම හා සම්බන්ධව 2007.11.29 වැනි දින මවිසින් පාර්ලිමේන්තුවේදී අසන ලද වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නයට අදාළව, 2008 වර්ෂයේදී මෙම පාසල ඉහත ව්‍යාපෘතියට ඇතුළත් කරන බවට පිළිතුරු ලබාදුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ යෝජනා අංක 2642 යටතේ මවිසින් ඉල්ලා සිටියේ එම "ඉසුරු" පාසල් ව්‍යාපෘතිය යටතේ පළමු පියවර ලෙස එම පාසලට සම්මන්ත්‍රණ ශාලාවක් සහිත නව ගොඩනැගිල්ලක් ලබා දෙන ලෙස බවත්;

(ii) එසේ වුවද, ගා/උඩුගම මහා විද්‍යාලය කණිෂ්ඨ අංශයක් ලෙස පවත්වාගෙන යාමට විදුහල්පතිවරයා අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා, මෙම පාසල "ඉසුරු" පාසල් ව්‍යාපෘතියෙන් ඉවත් කරන බවට අදාළ නිලධාරීන් දන්වා තිබූ බවත්;

(iii) කණිෂ්ඨ අංශයක් ලෙස වෙනම පවත්වාගෙන යන්නේ නම්, "ඉසුරු" පාසල් ව්‍යාපෘතියෙන් ඉවත්කර නොගන්නා බවට, 2008.05.06 වැනි දින පැවති අදාළ උපදේශක කාරක සභා රැස්වීමේදී පවසන ලද බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඒ අනුව "ඉසුරු" පාසල් ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය භෞතික සම්පත් ලබාදීම 2008 වර්ෂයේ කවර මාසයේ දී ආරම්භ කරන්නේ ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0740/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් 2007 ජුලි මස 20 වැනි දින "දිනමිණ" පුවත්පතේ දැන්වීමක් පළකර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ඉල්ලුම්කරුවන් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ලෙස පත් කිරීමට මෙතෙක් පියවර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දැනට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ලෙස පත්කර ඇති 11 දෙනා අතුරින් 09 දෙනෙකුට වැඩ බලන පත්වීම් සහ දෙදෙනෙකුට කොන්ත්‍රාත් පදනමින් පත්වීම් ලබා දී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) සුදුසුකම් තිබෙන අය කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවාගැනීම් සිදු නොකර, වැඩ බලන පත්වීම් ලෙස දිගින් දිගටම මෙම අධ්‍යක්ෂවරුන් තබා ගැනීමට හේතු කවරේද;

(ii) වැඩ බලන මෙම අධ්‍යක්ෂවරුන් අතර විනය විරෝධි කටයුතු සම්බන්ධව චෝදනා ලැබූ හෝ වැරදිකරුවන් වූ අය සිටීනම් ඔවුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) ඉහත සඳහන් පරිදි ඉල්ලුම් කර ඇති අයට සම්මුඛ පරීක්ෂණ පවත්වා දකුණු පළාතට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත්කිරීමට කොපමණ කාල සීමාවක් තුළ කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0860/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පිළියන්දල සමෘද්ධි බැංකු සංගමය තුළ 2006.10.30 වැනි දින හටගත් ගින්නකින් බොහෝ ලිපිද්‍රව්‍ය ඇතුළු උපකරණ විනාශ වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉතිරිව තිබූ ලිපිගොනු ආශ්‍රයෙන් බැංකු කටයුතු විධිමත් කිරීමට වසර 02 කට ආසන්න කාලයක් තුළ ගෙන ඇති පියවර කවරේද;

(ii) ගිනි ගැනීම හේතුවෙන් බොල් ණය බවට පත්වූ මුදල කොපමණද;

(iii) විධිමත් තත්වයට පත්කර ගැනීමට නොහැකි වූ කටයුතු කවරේද;

(iv) ගිනි ගැනිමෙන් පසු මේ වන තෙක් පලපුරුදු කළමනාකරුවෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(v) 2008.07.11 හා 2008.07.14 යන දිනවල බැංකු කටයුතු සිදු නොකර වසා දැමීමට සිදුවූයේ කවර හේතු නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සමෘද්ධි බැංකු සංගමයට අදාළ, අයිතිවාසිකම් අහිමිවූවන් වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0867/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 247 - මුරුතගස්පිටිය වසමේ ග්‍රාම නිලධාරි ඊ. ජේ. පී. ධර්මසේන මහතා 2008.05.10 වැනි දින පැවති නැගෙනහිර පළාත් සභා මැතිවරණ රාජකාරි කටයුතුවල යෙදුනු බව එතුමා දන්නෙහිද?

(ආ) බඹරවාන ඡන්ද මධ්‍යස්ථානයේ රාජකාරියෙහි නිරතව සිටියදී, නිලධාරීන්ට දිවා ආහාරය රැගෙන යන අවස්ථාවේදී මෙම ග්‍රාම නිලධාරිවරයා අමානුෂික මැර ප්‍රහාරයකට ලක්ව ආබාධිතයෙකු බවට පත්ව ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මැතිවරණ රාජකාරි කරන අතරතුර රජයේ නිලධාරියෙකුට පහරදීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගය කවරේද;

(ii) දැනට ආබාධිත තත්වයට පත්ව සිටින මෙම නිලධාරියාට සාධාරණත්වය ඉටු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 දෙසැම්බර් මස 03 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0748/'08

ගරු පේමසිරි මානගේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩඋඩ ග්‍රාම නිලධාරි විසින් 2008.06.29 වැනි ඉරිදා දින කෝට්ටෙගොඩ තැපැල් කාර්යාල භූමියට අයුතු ලෙස ඇතුල් වී එහි ඉදිකර තිබූ තාප්පය කඩා එහි බිම් කොටසක් නීති විරෝධී ලෙස අත්පත් කර ගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) ග්‍රාම නිලධාරිවරයෙක් රාජ්‍ය දේපලකට හානි කර එහි භූමිය අත්පත් කර ගැනීම බරපතල වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම නීතිවිරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ ලේකම්ට හා මාතර දිස්ත්‍රික් ලේකම් වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන තිබෙන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) රාජ්‍ය දේපලකට සිදුකර තිබෙන හානිය වැඩ තහනමකට ලක් කිරීමට තරම් වරදක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) එසේ නම්, මේ සම්බන්ධයෙන් අදාළ පියවර නොගැනීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0749/'08

ගරු පේමසිරි මානගේ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කෝට්ටෙගොඩ තැපැල් කාර්යාලය වටා ඉදිකර තිබූ තාප්පය කඩා එහි බිම් කොටසක්, ගොඩඋඩ ග්‍රාම නිලධාරි විසින් 2008.06.29 වැනි දින අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් දික්වැල්ල පොලීසියට ලිඛිත පැමිණිලි ලැබී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේනම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය දේපල විනාශ කර බලහත්කාරයෙන් කොටසක් අත්පත්කර ගැනීම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට තරම් බලවත් වරදක් බවත්;

(ii) අධිකරණ තීන්දු නොසලකා රාජ්‍ය දේපල බලහත්කාරයෙන් අත්පත්කර ගැනීම දඬුවම් ලැබිය යුතු වරදක් බවත්;

(iii) අදාළ ග්‍රාම නිලධාරිවරයා සම්බන්ධයෙන් නෛතික පියවර ගතයුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඉහත නිලධාරියා සම්බන්ධයෙන් නෛතික පියවර ගන්නේ නම්, ඒ කවරේද;

(ii) ඒ කවර කාලයක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0741/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගා/උඩුගම දිසා රෝහල, මූලික රෝහලක් ලෙස සංවර්ධනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අනුමත වී ඇති බවත්;

(ii) මේ වනවිට පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමතිය යටතේ මූලික රෝහලක් සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කෙරෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට රෝහලේ තිබෙන නව ගොඩනැගිලි හැරුනු විට අනෙක් සියලුම ගොඩනැගිලි ඉතාම අබලන් තත්වයේ පවතින පැරණි ගොඩනැගිලි බවත්;

(ii) මූලික රෝහලට අවශ්‍ය නව ගොඩනැගිලි ඉදිකරන තෙක් එම ගොඩනැගිලි පාවිච්චියට ගතහැකි වුවද නව ඉදිකිරීම්වලදී පැරණි ගොඩනැගිලි ක්‍රමානුකූලව ඉවත් කළ යුතු බවත්;

(iii) කරාපිටිය රෝහලේ පවතින අධික තදබදය අඩු කිරීමට හා උඩුගම රෝහලට ආසන්න රෝගීන් රඳවා තබා ගැනීමට මෙම රෝහල කඩිනමින් සංවර්ධනය කළ යුතු බවත්;

(iv) සුනාමි, ගංවතුර වැනි හදිසි තත්වයකදී වුවද කිසිම අනතුරක් නොමැති, ප්‍රදේශයේ එකම රෝහල මෙය බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මූලික රෝහලේ ඉදිකිරීම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට තනිවම සිදුකළ නොහැකි බැවින්, ඔවුන් සමග සාකච්ඡා කර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පියවරෙන් පියවර ලබාදීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0742/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) උඩුගම ඩිපෝවට අයත් බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අතුරින් ධාවනයට සුදුසු සංඛ්‍යාව කොපමණද;

(iii) සුලු අලුත්වැඩියාවන්ගෙන් පසුව ධාවනය කළ හැකි බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ධාවනයට යොදාගත නොහැකි බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඩිපෝවේ ඩිපෝ අධිකාරිවරයාගේ සිට සාමාන්‍ය සේවකයා දක්වා කොපමණ කාර්ය මණ්ඩලයක් සිටීද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රියදුරන්, කොන්දොස්තරවරුන් සහ රාත්‍රී වැඩමුරයේ යෙදෙන කාර්මික නිලධාරීන් සඳහා අවශ්‍ය නේවාසික පහසුකම් ඉතාම අසතුටුදායක මට්ටමක තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) සියලුම සේවක මහත්ම මහත්මීන් සඳහා අවශ්‍ය පිරිසිදු පානීය ජලය තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) ඔවුන්ට අවශ්‍ය ආපනශාලා පහසුකම් ක්‍රමවත්ව නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අවම පහසුකම් සහිතව ඉතා ඉහල සේවාවක් සපයන මෙම ඩිපෝවේ සේවක මහත්ම මහත්මීන් සඳහා ඉහත සඳහන් කරන ලද අඩු පහසුකම් සම්පූර්ණ කිරීම කොපමණ කාල සීමාවක් තුළ සිදු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0743/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මා විසින් ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු උපදේශක කාරක සභා අංක 2647 දරන යෝජනාවට පිළිතුරු ලෙස ගා/නාගොඩ රාජකීය ජාතික පාසලේ අත්‍යාවශ්‍ය ගුරු පුරප්පාඩු හැකි ඉක්මණින් සම්පූර්ණ කරන බව අදාළ නිලධාරීන් ප්‍රකාශ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුරු පුරප්පාඩු අතර චිත්‍ර 6-11 වසර විද්‍යාව, උසස් පෙළ සංයුක්ත ගණිතය, තර්ක ශාස්ත්‍රය, ක්‍රීඩා හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා පුරප්පාඩු තිබෙන බව අදාළ විදුහල්පතිවරයා විසින් සඳහන් කර ඇති බවත්;

(ii) 2008 වසරේ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ගෙන් ඉහත පුරප්පාඩු සම්පූර්ණ කරන බව අධ්‍යාපන අධ්‍යක්ෂ (ගුරු මාරු) ජේ. එච්. එම්. ඩබ්ලිව්. රංජිත් මහතා විසින් අංක ED/01/27/01/09/2008-G දරන 2008.02.25 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) 2008 ජුලි මස වනවිට පොරොන්දු වූ ප්‍රමාණයෙන් කොපමණ ගුරුවරුන් සංඛ්‍යාවක් අදාළ පාසලට ලබා දී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ගුරු හිඟය නිසා මෙම පාසලේ අධ්‍යාපන කටයුතු වලට බාධා පැමිණ ඇති බැවින් උපදේශක කාරක සභාවේදී එකඟවූ පරිදි ඉහත පුරප්පාඩු සම්පූර්ණ කිරීමට එතුමා කඩිනමින් පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0778/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දික්වැල්ල ප්‍රධාන තැපැල් කාර්යාලය සුනාමියට ලක්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දැනට භාවිතා කරන්නේ එම තැපැල් කාර්යාලයද;

(ii) මාර/විජිත ජාතික පාසලට සමීපව පිහිටි නව ගොඩනැගිල්ල තැපැල් කාර්යාලය සඳහා ඉදි කරන ලද්දේද;

(iii) එහි ඉදිකිරීමේ කටයුතු අවසන් වුයේ කවදාද;

(iv) අදාළ ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(v) මූල්‍යමය දායකත්වය සැපයුවේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දික්වැල්ල ප්‍රධාන බස්රථ නැවතුම්පොළේ සිට එම අලුතින් ඉදිකළ ගොඩනැගිල්ලට ඇති දුර කොපමණද;

(ii) සුනාමියට ලක් වූ තැපැල් කාර්යාලයට එම බස්රථ නැවතුම්පොළේ සිට ඇති දුර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'08

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ අම්බලන් වත්ත හෙවත් මල්බෙරි වත්තේ රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ඉඩම් කවර අවශ්‍යතා සඳහා වෙනත් පාර්ශ්වයන් වෙත ලබාදීමට කටයුතු කර තිබේද;

(iii) එසේනම්, ඒ කොපමණ ඉඩම් ප්‍රමාණය බැගින්ද;

(iv) ඒ කවර පදනමක් මතද;

(v) මාර්ග සංවර්ධන අධිකාරියට කොටසක් විකිණීමට තීරණය කර තිබේ නම් අදාළ ඉඩම් ප්‍රමාණය සහ විකිණීමට හේතුව කවරේද;

(vi) විකිණීමකින් තොරව වෙනත් කවර හෝ පදනමක් මත ලබාදීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කඩුවෙල ප්‍රදේශයේ ක්‍රීඩා පිටියක අවශ්‍යතාවයක් පවතින බව හා ඒ සඳහා යොදා ගතහැකි වෙනත් රජයේ ඉඩමක් නොමැති බවත්;

(ii) ඒ සඳහා මෙම ඉඩම ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලා තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඒ සඳහා ඉහත ඉඩම ලබාදීමට නොහැකි නම් ඊට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0412/'08

ගරු පියසිරි විජේනායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෑතකදී විභාග දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ තරඟ විභාගයකින් ලංකා බැංකුවට සේවකයින් බඳවා ගත්තේ කවර තනතුරක් සඳහාද;

(ii) එම තනතුරට බඳවාගත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරට බඳවාගත් අපේක්ෂකයින් තරඟ විභාගයේදී ලබා ගත් ලකුණු ප්‍රමාණයන් කවරේද;

(iv) එම එක් එක් අපේක්ෂකයා තම දිස්ත්‍රික්කය අනුව ලබාගත් ලකුණු හා ස්ථානය කවරේද;

(v) දිස්ත්‍රික්ක අනුව බඳවා ගත් අයගේ විස්තර කවරේද;

(vi) තෝරාගත් අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්මුඛ පරීක්ෂණයට කැඳවූ අපේක්ෂකයින් තරඟ විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු ඇතුළත් ලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2008 දෙසැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0744/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2005 වර්ෂය වනවිට කොපමණ මාර්ග සංඛ්‍යාවකට ගා/උඩුගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල (ශ්‍රී ලංගම) ඩිපෝවට අයත් බස් රථ ධාවනය කරන මාර්ග බලපත්‍ර (කාල සටහන්) තිබුණේද යන්න විස්තරාත්මකව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පැරණි කාල සටහන් අනුව 2008 ජුලි මස වනවිට කොපමණ මාර්ග සංඛ්‍යාවක බස් රථ ධාවනය කරන්නේද;

(ii) පැරණි කාල සටහන් අනුව කොපමණ මාර්ග සංඛ්‍යාවක බස් රථ ධාවනය කිරීම මේ වනවිට නවතා තිබේද;

(iii) ඒ සඳහා බලපා ඇති හේතු කවරේද

(iv) කොළඹ බලා ධාවනය කරන ලද ගමන් වාර සංඛ්‍යාව අඩුකර තිබේද;

(v) උඩුගම - මණ්ඩලපුර, නෙලුව, වාරුකන්දෙනිය සහ තවලම හල්විටිගල ජනපදය දක්වා ගමන් කරමින් තිබූ බස් රථ නියමිත පරිදි ධාවනය වන්නේද;

(vi) පාසල් ළමුන්ට ගමන් කළ හැකි ලෙස සකස් කර තිබුණු උඩුගම ඩිපෝවෙන් ධාවනය වන ගමන් වාර අඩු කිරීමකින් තොරව ධාවනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉතාම කාර්යක්ෂම ඩිපෝවක් ලෙස තිබූ උඩුගම ඩිපෝවේ බස්රථ ගමන්වාර පාසල් සිසුන්ට සහ ජනතාවට පහසුවන අයුරින් සංශෝධනය කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0745/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගා/නාගොඩ රාජකීය ජාතික පාසලේ සිසු දරු දැරියන්ට පානීය ජලය ලබා ගැනීමට තිබූ පැරණි ළිඳ මේ වනවිට කඩා වැටී ඇති බවට වාර්තා වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉතා පැරණි ළිඳක් වන මෙය 2003 ගංවතුරටද හසු නොවීම නිසා එම අවස්ථාවේ ප්‍රදේශයටම පානීය ජලය සපයනු ලැබුවේ මෙම ළිඳෙන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ළිඳ පාවිච්චියට ගත නොහැකි නිසා, 2008 ජුනි මස ඇතිවූ ගංවතුරටද හසුව අත් හැර දමන ලද පැරණි ළිඳක් පාසල් සංවර්ධන සමිතියේ මැදිහත්වීමෙන් පවිත්‍ර කොට පානීය ජලය ලබාගැනීම සඳහා මේ වනවිට පාවිච්චි කරන බව එතුමා දන්නෙහිද?

(ඈ) විශාල සිසු සිසුවියන් පිරිසක් අධ්‍යාපනය ලබන මෙම පාසලට පානීය ජලය ලබාගැනීමට සිදුවී තිබෙන්නේ ගංවතුරටද හසුවන අනාරක්ෂිත පැරණි ළිඳකින් බැවින්, 2008 වර්ෂය අවසාන වීමට පෙර කඩාවැටී ඇති ළිඳ ආසන්නයෙන් නව ළිඳක් සකස් කර පාසල් දරුවන්ට පානීය ජලය ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0746/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් කැටගොඩ 214 B ග්‍රාමසේවා වසමේ පිහිටි කැටගොඩ පාසල අසලින් තිබෙන මාර්ගයේ කොටසක් මේ වනවිට රජයේ සහ වෙනත් ප්‍රතිපාදන යොදාගෙන සකස්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ වුවද කැටගොඩ පන්විල අසල සිට පාලම දක්වා වූ මාර්ග කොටසින් වැඩි ප්‍රමාණයක් වාහන ගමන් කිරීමට අපහසු ලෙස අබලන්වී ඇති බවත්;

(ii) එහි අතුරු මාර්ගයක් වූ කුරුඳුහේන හරහා පන්විල දක්වා ඇති මාර්ගය පස් දමා සකස් කළද වර්ෂයේ වැඩි කාලයක් මෙම ප්‍රදේශයට වැසි ලැබෙන බැවින් එම මාර්ගයද ගමන් කිරීමට අපහසු ලෙස ඉතාම අබලන්වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) තේ ආර්ථිකයෙන් ජීවිකාව ගෙන යන වැඩි පිරිසක් ජීවත්වන මෙම ගම්මානයේ ජනතාවගේ තේ දළු ප්‍රවාහනය ඇතුළු අත්‍යාවශ්‍ය කටයුතු සිදු කර ගැනීම සඳහා මෙම මාර්ග දෙකේ ඉතාම අබලන් වූ ස්ථාන කොන්ක්‍රීට් දමා සකස්කර දීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) කැටගොඩ පාලමද ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ සකස් කරමින් තිබෙන බැවින් අදියර කිහිපයකට හෝ මෙම මාර්ග සකස් කිරීමට කොපමණ කාල සීමාවක් තුළ කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0861/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉන්දීය හමුදාවේ මියගිය සෙබලුන් සිහිකිරීම පිණිස ශ්‍රී ජයවර්ධනපුර, බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයේ ස්මාරකයක් ඉදිකර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) ඉදිකිරීම් සිදුකළ ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(iii) අදාළ ඉදිකිරිම සිදුකළ බිම් කොටසේ වටිනාකම කොපමණද;

(iv) එම ස්මාරකය විවෘත කිරීමක් සිදුවූයේද;

(v) එසේ නම්, ඒ කවදාද;

(vi) විවෘත කළේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකාවේ උතුරු මුහුදු කලාපයේ අප රටට අයත් මුහුදු සීමාව වෙරළේ සිට කොපමණ දුරකින් පිහිටා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරේ මුහුදු සීමාව සම්බන්ධයෙන් "සාර්ක්" සමුළුවේ දී කවර හෝ තීරණයක් ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ගනු ලැබූ තීරණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉන්දීය ධීවරයින් ලංකාවට අයත් මුහුදු සීමාවේ මසුන් මැරීම සම්බන්ධයෙන් මේ වනවිට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0587/'08

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 මැයි මස 30 වැනි දිනට රටේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(iii) පෙර මාසයේ, එනම් 2008.04.30 වැනි දිනට විදේශ ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඒ අනුව මාසයක් තුළ වැඩි වූ ණය ලබාගෙන වියදම් කරන ලද්දේ කවර කටයුතු සඳහාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0593/'08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර මොණරාගල දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට මොණරාගල දිස්ත්‍රික්කය තුළ ඇති ,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0598/'08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර මහනුවර දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0599/'08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පැවති

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0761/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ගාල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිලි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0762/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, හබරාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) හබරාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිලි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0763/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, ඉමදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉමදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0553/'08

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජතෙල් සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ දක්වා වූ පසුගිය වසර 15ක කාලය තුළ ඉරානයෙන් ආනයනය කර ඇති බොරතෙල් ප්‍රමාණය කොපමණද;

(ii) අප විසින් ඉරානයෙන් මිලදී ගත් තෙල් සඳහා ගෙවූ මිල සහ ලෝක වෙළෙඳපොලේ එදිනට පැවති මිල කොපමණද;

(iii) එම තෙල් අප මිලදී ගත්තේද නැතහොත් ණයට ගත්තේද;

(iv) එලෙස ණයට ගත්තේ නම්, ණය ආපසු ගෙවිය යුතු කාල සීමාව සහ එහි පොළී අනුපාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉරානයෙන් ලබාගත් ඛනිජතෙල් සඳහා මේ දක්වා ගෙවීමට ඇති මුළු මුදල කොපමණද යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0595/'08

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර අම්පාර දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට අම්පාර දිස්ත්‍රික්කය තුළ ඇති ,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0596/'08

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර යාපනය දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට යාපනය දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0594/'08

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 අයවැය ලේඛණයෙන් පොරොන්දු වූ පරිදි උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ අනුව මේ වනවිට (2007 වර්ෂය තුළ සහ 2008 වර්ෂය තුළ මේ දක්වා) ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර ක්ෂේත්‍රවල, කවර සංඛ්‍යාවක්ද;

(iii) රැකියා ලබා නොදුන් උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ට කඩිනමින් රැකියා ලබාදීමට ආරම්භකර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0620/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0621/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර පුත්තලම දිස්ත්‍රික්කය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0774/'08

ගරු එම්.ඩී. නාමල් කරුණාරත්න මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදකන්ද හා මඩහපොළ ග්‍රාම නිලධාරී වසම්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිතයන්හි පාරිසරික වටිනාකම කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිතවල හේන් ගොවිතැන් කරන ගොවීන් කොපමණ සංඛ්‍යාවකට එරෙහිව 2006/2007 වර්ෂවල නඩු පවරා තිබේද;

(ii) එකී නඩුවල දී දඩ මුදල් ලෙස අයකර ගෙන ඇති මුදල කොපමණද;

(iii) වෙනත් දඬුවම් ලබාදී තිබෙන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත රක්ෂිතවල "ගම්බද වන වගා වැඩසටහන" යටතේ ගැමියන් විසින් වගාකර ඇති කොහොඹ, තේක්ක, කජු හා ඇකේෂියා වැනි ශාඛ සහිත රක්ෂිත වනය කෑගල්ල ප්‍රදේශයේ පදිංචි නිමල් කත්‍රිආරච්චි යන අයට ඇති පෞද්ගලික ඔප්පුවක් මත ඔහුගේ අයිතියට ලබාදීම සඳහා රක්ෂිත මායිම් වෙනස් කර තිබේද;

(ii) අදාළ දැනුවත් කිරීම් මත මැනුම් කටයුතු අවසන් කළද රක්ෂිතයේ මායිම සලකුණු කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) අදාළ මායිම කඩිනමින් සලකුණු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 දෙසැම්බර් මස 08 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0764/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල කරන්දෙනිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කරන්දෙනිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0765/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0766/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල ගෝනාපීනුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(ii) එම ප්‍රදේශයේ ජනගහනය අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය සංඛ්‍යාත්මකව කොපමණද;

(iii) ඒ අනුව සිටිය යුතු කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය අතර වෙනස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කාර්ය මණ්ඩලයේ ගමන් වියදම් ඇතුළු ගෙවීම් හිඟයකින් තොරව ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ගෝනාපීනුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (M. O. H.) කාර්යාලයට අයත් කොට්ඨාසය තුළ පිහිටි, ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ ජලය, විදුලිය, බර කිරීමේ උපකරණ සහ පැමිණෙන මව්වරුන්ට ආසන පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) වැසිකිළි තැනීමේදී උපකෘත යෝජනාක්‍රමය යටතේ අවශ්‍ය වැසිකිළි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම කාර්යාලය සතුව වාහන පහසුකම් තිබේද;

(ii) ඒ සඳහා මසකට ලබාදෙන ඉන්ධන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට නියමිත යතුරුපැදි ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, කොපමණ කාල සීමාවක් තුළ ඒවා ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0554/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අප රට 1948 සිට අද දක්වා ලබාගෙන ඇති සමස්ත දේශීය හා විදේශීය රාජ්‍ය ණය මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් ණය මුදල් ලබාගැනීමේදී දැරීමට සිදුවූ වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) සමස්ත රාජ්‍ය ණය, සමස්ත රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0555/'08

ගරු රවි කරුණානායක මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාර්ග සංවර්ධනය සහ නඩත්තුව උදෙසා පසුගිය වසර පහක කාලය තුළ වාර්ෂිකව වෙන්කළ මුදල් ප්‍රමාණය සහ ඉන් සැබෑ ලෙසම වියදම් කළ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස නඩත්තු කළ මාර්ග අතුරින් වැදගත් මාර්ග දහයේ නම් සහ ඒ එකිනෙක මාර්ග සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිකිරීමට නියමිත නව මහාමාර්ග සහ අධිවේගී මාර්ගවල නම් කවරේද;

(iii) ඒවායේ ඇස්තමේන්තුගත වියදම, එකී මාර්ගවල වැඩ ඇරඹීමට නියමිත දිනයන් හා වැඩ නිම කිරීමට නියමිත දිනයන්ද සමග කවරේද;

(iv) මිල ගණන් ඉදිරිපත්කර ඇති ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් කවරේද;

(v) අරමුදල් ලැබෙන මූලාශ්‍රය සහ ණය මුදල සඳහා අයකරනු ලබන පොළී අනුපාතිකයද සමග මුළු වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?